# හරියට දැනගෙන හරි පාරෙන් සුරක්ෂිතව රට යන්න



In Close Collaboration with

**Ministry of Labour and Foreign Employment**


**Supported by:**


Schweizerische Eidgenossenschaft
Confederation Suisse
Confederazione Svizzera
Confederaziun Svizra
**Embassy of Switzerland to Sri Lanka and the Maldives**

**Implemented by:**

SAFE Foundation

## සංක්‍රමණය සිදුවන ආකාරය

පුද්ගලයින් තම රටෙන් පිටත්ව වෙනත් රටකට යාම බාහිර හෝ අන්තර්ජාතික සංක්‍රමණය වේ.




පුද්ගලයින් තමන්ගේ රට ඇතුළත සංක්‍රමණය වීම අභ්‍යන්තර සංක්‍රමණය වේ.


## විධිමත් සංක්‍රමණය යනු

- සුරක්ෂිත හා ක්‍රමවත්
- පදිංචි රටෙහි, අතරමැදි රටවල සහ ගමනාන්ත රටෙහි නීතිවලට අනුකූලව සිදුවන සංක්‍රමණය.

## විධිමත් සංක්‍රමණ මාර්ග මොනවාද ?

කොන්දේසි මත පදනම්ව සහ ගමනාන්ත රට විසින් නිශ්චිතව දක්වා ඇති කාල සීමාවක් සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ට විධිමත් ලෙස අදාළ ගමනාන්ත රටට සංක්‍රමණය වීමට ඉඩ සලසන සංක්‍රමණ යෝජනා ක්‍රම වේ.

## ශ්‍රම සංක්‍රමණයේ අවධි




## ශ්‍රී ලංකාවේ ශ්‍රම සංක්‍රමණයට අදාළවන නීතිමය තත්වයන්

**1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව**

- ශ්‍රී ලාංකිකයින්ට වැඩකිරීමේ අයිතිය සහ ගමන් කිරීමේ නිදහස තිබේ
- මෙම මූලික අයිතිවාසිකම් එක්වී ශ්‍රී ලාංකිකයන්ට විදේශ රැකියා සඳහා සංක්‍රමණය වීමට සහ තමන් කැමති වේලාවක ආපසු පැමිණීමට ඇති අයිතිය නිර්මාණය කරයි.
- සෑම පුරවැසියෙකුටම තනිව හෝ අන්අය සමග යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායකයක නියුක්ත වීමේ නිදහස
- ශ්‍රී ලංකාව තුල යාම්/ ඒම් නිදහස සහ අභිමත ස්ථානයක වාසය කිරීමේ නිදහසට සහ ශ්‍රී ලංකාවට පෙරලා පැමිණීමේ නිදහසට හිමිකම් ඇත්තේය.

# සංක්‍රමණය සහ ශ්‍රම සංක්‍රමණය පිළිබඳ අන්තර්ජාතික බැඳීම්

සියළුම සංක්‍රමණික සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය, 1990

ගොඩබිමෙන්, මුහුදෙන් සහ ගුවනින් සංක්‍රමණිකයන් ජාවාරම් කිරීමට එරෙහි කෙටුම්පත - ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධ මැඩපැවැත්වීම

කලාපීය සහයෝගීතාවය සඳහා වන දකුණු ආසියානු සංගමයේ (සාර්ක්) ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් වෙළඳාම් කිරීම වැළැක්වීම සහ මර්දනය කිරීම පිළිබඳ සම්මුතිය

United Nations
Network on Migration
*Working Better Together*

Global Compact
FOR Migration

Global Forum on
MIGRATION & DEVELOPMENT
GFMD UAE 2020


## ශ්‍රම සංක්‍රමණය සඳහා වූ ජාතික වගකීම්



- 1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
- ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2008)
- ශ්‍රී ලංකා ජාතික සංක්‍රමණ සෞඛ්‍ය ප්‍රතිපත්තිය

## විධිමත් ලෙස සංක්‍රමණය වන ඔබට හා ඔබේ පවුලට ලැබෙන ප්‍රතිලාභ

### විධිමත් ශ්‍රම සංක්‍රමණයෙහි ප්‍රතිලාභ



# විධිමත් ලෙස සංක්‍රමණය වන ඔබට හා ඔබේ පවුලට ලැබෙන ප්‍රතිලාභ

## විධිමත් ශ්‍රම සංක්‍රමණයෙහි ප්‍රතිලාභ

- නිවාස
- අධ්‍යාපනය
- ණය බරෙන් නිදහස් වීම
- වඩා හොඳ ජීවන තත්ත්වය
- වඩා හොඳ සේවා සහ නිෂ්පාදන වෙත ප්‍රවේශය

→ පවුල

## විධිමත් ශ්‍රම සංක්‍රමණයෙහි ප්‍රතිලාභ

- පුහුණු සහ උගත් ප්‍රජාව
- දිළිඳුකම තුරන් වීම
- වඩා හොඳ අවස්ථා
- වඩා හොඳ ජීවන තත්ත්වයන්
- ස්වයංපෝෂිත වීම

→ ප්‍රජාවට

**විධිමත් ලෙස සංක්‍රමණය වන ඔබෙන්, වඩා යහපත් සමාජයක්, රටක් බිහිකිරීමට ලැබෙන්නේ මහඟු දායකත්වයකි.**

## විධිමත් ශ්‍රම සංක්‍රමණයෙන් ප්‍රජාවට හා රට ලැබෙන ප්‍රතිලාභ

### විධිමත් ශ්‍රම සංක්‍රමණයෙහි ප්‍රතිලාභ

- විදේශ විනිමය
- විරැකියාව අඩුවීම
- වඩා හොඳ ජීවන තත්ත්වය
- රජය මත යැපීම අඩු වීම
- අයවැය ප්‍රතිපාදන වැඩි විම

→ රටට

## සංක්‍රමණය වීම සඳහා සූදානම් වීමේ හා දැනුවත්භාවයෙන් යුතුව තීරණ ගැනීමේ වැදගත්කම

**තීරණය කිරීමේ පියවර**

**විධිමත් සංක්‍රමණය**

1. ඔබ සංක්‍රමණය වීමට ගන්නා තීරණය ඔබේ ජීවිතය සහ ඔබේ ආදරණීයයන්ගේ ජීවිත වඩාත් යහපත් කරයිද?
2. ඔබ විදේශගතවී කිරීමට බලාපොරොත්තු වන රැකියාව පිළිබඳව ඔබට හොඳ අදහසක් තිබේද?
3. වෙනස් වූ සංස්කෘතික/ පාරිසරික තත්වයන්වල ජීවත් වීමට ඔබ කායිකව හා මානසිකව සූදානම් ද?
4. විදේශ රැකියාවක් ලබා ගැනීම සඳහා අවශ්‍ය වියදම් පියවා ගැනීමට ඔබට මුදල් තිබේද?

# සුරක්ෂිත ශ්‍රම සංක්‍රමණයට පෙර ඔබ දැනගත යුතු තොරතුරු

## නීත්‍යානුකූල විදේශ රැකියාවක් ලබාගත හැකි ආකාර

**නීත්‍යානුකූලව විදේශ රැකියාවක් ලබා ගැනීමට අපේක්ෂා කිරීම**

- **මිතුරෙකු හරහා**
  - එය නීත්‍යානුකූල සහ සුරක්ෂිත රැකියාවක්ද?
- **බලපත්‍රලාභී නියෝජිත ආයතනයක් හරහා**
  - බඳවා ගැනීම සිදු කරන තුරු පළමු අනුමැතිය වලංගුද?
  - නියෝජිතයා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් අවශ්‍ය අනුමැතීන් ලබාගෙන තිබේද?
  - බඳවා ගැනීම සිදු කරන තුරු බලපත්‍රය වලංගුද?
  - ඔබගේ නියෝජිතයා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී බලපත්‍ර ලබා තිබේද?

# සුරක්ෂිත ශ්‍රම සංක්‍රමණය සඳහා විධිමත්ව සූදානම් විය යුතු ආකාරය

- **ඔබ ගෙවිය යුත්තේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් නිශ්චිතව දක්වා ඇති ගාස්තුව පමණි.**
  **(අවශ්‍ය නම් ඔබට පුහුණුව ලබා ගැනීමට නියම කරනු ලැබිය හැක)**
- **රැකියා ගිවිසුමේ අත්සන් කළ පිටපතක් ඔබ සතුව තිබිය යුතුය.**
- **ඔබ විසින් අත්සන් කල රැකියා ගිවිසුමේ කොන්දේසි සහ වෙබ් අඩවිය මගින් පළ කර ඇති සේවා තනතුරට අදාල කොන්දේසි සමාන දැයි පරීක්ෂා කර බලන්න**
- **ඔබ වෛද්‍ය පරීක්ෂණයකට භාජනය වී අවශ්‍ය වෛද්‍ය නිෂ්කාශනය ලබා ගත යුතුය**
- **ඔබගේ නියෝජිතයා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙතින් අවශ්‍ය අනුමැතීන් ලබාගෙන පහත සඳහන් ලියවිලි ඔබ වෙත භාර දිය යුතුය**
  - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි කිරීමේ මුද්‍රාව මගින් අනුමත කර ඇති ඔබගේ විදේශ ගමන් බලපත්‍රය
  - වලංගු වීසා බලපත්‍රය
  - ගුවන් ටිකට් පත
  - රැකියා ගිවිසුම
  - බැංකු පත්‍රිකාවේ ගණුදෙනුකරුගේ පිටපත
  - රක්ෂණ සහතිකය

## රැකියා ගිවිසුම හෝ කොන්ත්‍රාත්තුවේ දී සැළකිලිමත් විය යුතු කරුණු

**නියෝජිතයෙකු විසින් බඳවා ගැනීම සිදු කරන්නේ නම්:**

- සේවායෝජකයාගේ අත්සන
- විදේශීය නියෝජිතයාගේ සහ දේශීය නියෝජිතයාගේ අත්සන
- සේවකයාගේ අත්සන
- තානාපති කාර්යාලයේ/ කොන්සල් නිලධාරියාගේ අත්සන

**ඔබගේ අත්සන තැබීමට ප්‍රථමයෙන් ඔබ වාචික ලෙස එකඟ වූ කරුණු තත්වයන් එම රැකියා ගිවිසුමේ, කොන්තරාත්තුවේ සඳහන් වේ දැයි නැවත පරීක්ෂා කර බලන්න.**

## රැකියා ගිවිසුමේ සඳහන් විය යුතු කරුණු

- සේවා යෝජකයා හා කම්කරුවාගේ නම සහ ලිපිනය
- සාමාන්‍ය සේවා ස්ථානයේ/ ස්ථානවල ලිපිනය
- ගිවිසුම ආරම්භවන දිනය සහ බලපවත්වන කාල සීමාව
- ඉටුකළ යුතු රැකියා වර්ගය
- වැටුප
- සාමාන්‍ය වැඩ පැය ගණන
- වාර්ෂික නිවාඩු කාල පරිච්ඡේද
- ආහාර හා නවාතැන් සම්පාදනය
- පරිවාස කාල සීමාව
- නැවත සිය රටට යැවීමේ කොන්දේසි
- අවසන් කිරීම හා දැනුම් දීම පිළිබඳ කොන්දේසි



# සංක්‍රමණ ක්‍රියාවලියේ දී කළ යුතු දේ සහ නොකළ යුතු දේ

## සංක්‍රමණය වීමට සූදානම් වන විට කළ යුතු දේ



- ඔබේ වගකීම් භාර ගැනීම සුදුසුම පුද්ගලයින්ට පවරන්න
- මුදල් කළමනාකරණය කිරීමට සැලසුම් කරන්න
- අදාළ ලියවිලිවල පිටපත් නිවසේ තබන්න
- අදාළ රාජ්‍ය නිලධාරීන් හමුවී ඔබගේ සංක්‍රමණය පිළිබඳව ඔවුන්ට දැනුම් දෙන්න (උදා: විදේශ රැකියා සංවර්ධන නිළධාරී/ග්‍රාම නිළධාරී/දරුවාගේ පන්ති භාර ගුරුභවතුන්)
- ඔබ යන රට, රැකියාව සහ සේවායෝජකයා පිළිබඳව දැනුවත් වන්න/එම රටේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සම්බන්ධ කර ගත හැකි තොරතුරු ලබාගන්න.
- ඔබේ පවුල සමග සම්බන්ධ වීමට සමාජ මාධ්‍ය භාවිතා කිරීමට සූදානම් වන්න

## සංක්‍රමණය වීමට සැලසුම් කරන විට නොකළ යුතු දෑ



- හිස් ලියවිලිවලට අත්සන් නොකරන්න.
- භාරගත් බවට ලදුපතක් ලබා නොගෙන ඒජන්සි ආතනය හෝ ඔහුගේ නියෝජිතයෙකු භාරයේ ලියවිලි තබා නොයන්න.
- මුදල් භාරගත් බවට කුවිතාන්සියක් ලබා නොගෙන කිසිදු ගාස්තුවක් නොගෙවන්න
- ඔබට වාචිකව ලබා දී ඇති තොරතුරු විශ්වාස නොකරන්න
- අදාළ බලධාරීන්ට නොදන්වා පිටත්ව නොයන්න.

## පිටත්ව යන සංක්‍රමණික සේවකයින් සැලකිල්ලට ගත යුතු කරුණු කිහිපයක්

- නියමිත වේලාවට ගුවන් තොටුපළට පැමිණෙන්න
- වෙහෙස නිවා ගන්න
- ලියවිලි ආරක්ෂිතව සහ ඔබට සමීපව තබා ගන්න



## සංක්‍රමණ ක්‍රියාවලියේ ආයතන හා නිලධාරීන්

- කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යාංශය
- විදේශ කටයුතු අමාත්‍යාංශය (කොන්සියුලර් අංශය)
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
- ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල
- ග්‍රාම නිළධාරී



- විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ කාර්යාලය
- විදේශ රැකියා සංවර්ධන නිළධාරී
- ශ්‍රී ලංකා පොලීසිය
- බැංකු සහ මුදල් ණයට දෙන්නන්
- බදවා ගැනීමේ නියෝජිතයින්
- ගුරුවරු/විදුහල්පති

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සංක්‍රමණික සේවකයින්ට පිරිනමනු ලබන සේවා

| සංක්‍රමණයේ අවධිය | ලබා දෙනු ලබන සේවා |
| --- | --- |
| **පිටත්වීමට පෙර අවධිය** | ▪ පිටත්වීමට පෙර පුහුණුව<br>▪ පිටත්වීමට පෙර ලබා දෙන ණය පහසුකම<br>▪ පිටත් වීමට පෙර හුරුකිරීමේ පුහුණුව<br>▪ රැකියා ගිවිසුම<br>▪ පිටත්වීමට පෙර අනුමැතිය<br>▪ අනිවාර්ය ලියාපදිංචිය |
| **සේවාස්ථ අවධිය** | ▪ දුක්ගැනවිලි මෙහෙයවීම<br>▪ සංක්‍රමණික සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව<br>▪ අඩු පොළී ණය |
| **ආපසු පැමිණීම** | ▪ ආපසු පැමිණීම සහ නැවත සමාජගතවීම<br>▪ රක්ෂණ හිමිකම් ලබා ගැනීම<br>▪ ණය පහසුකම්<br>▪ පෙර ඉගෙනුම් පිළිගැනීමේ පුහුණුව |

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්යභාරය

- විදේශ රැකියා අවස්ථා ප්‍රවර්ධනය/ සංවර්ධනය කිරීම
- විදේශ රැකියා නියෝජිතායතන නියාමනය කිරීම
- විදේශ රැකියා නියෝජිතායතනවලට වර්ධනය වීමට සහ සංවර්ධනය වීමට සහාය වීම
- විදේශ රැකියා සඳහා ප්‍රමිතීන් සකස් කිරීම
- විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම;
- සංක්‍රමණික ශ්‍රමිකයින්ගේ සුබසාධනය සහ ආරක්ෂාව සඳහා විධිවිධාන සැලසීම
- සංක්‍රමණික සේවකයින්ගේ පුහුණු කිරීම් සහ හුරුකිරීමේ වැඩසටහන් පැවැත්වීම
- සංක්‍රමණික සේවකයින්ගේ ලියවිලි සත්‍යාපනය කිරීම.

**වැඩි විස්තර සඳහා : http://www.slbfe.lk වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.**

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහන පියස මගින් සලසන සේවා

01 විදේශයන්හි මියයන සංක්‍රමණික සේවකයින්ගේ පවුල්වලට අවමංගල්‍ය කටයුතු සඳහා වියදම් ගෙවීම

02 පිටත්වීමට පෙර නවාතැන් පහුසකම් අවශ්‍ය සංක්‍රමණික සේවකයන්ට නවාතැන් පහසුකම් සපයා දීම

03 ලියාපදිංචිය අලුත් කිරීම

04 රක්ෂණ හිමිකම් පෝරම භාර ගැනීම සහ ඒවා ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීම

05 රැකියා ස්ථානයේ ගැටළු හෝ රෝගී තත්වයන් හේතුවෙන් ආපසු පැමිණෙන සංක්‍රමණික සේවකයින්ට නවාතැන්, ප්‍රවාහනය, ආහාර, ඖෂධ සහ ගමන් වියදම් වැනි පහසුකම් සපයා දීම

## විදේශ කටයුතු අමාත්‍යංශයේ කොන්සියුලර් අංශය සංක්‍රමණික ශ්‍රමික සේවකයින් සඳහා සපයනු ලබන සේවාවන්

- ලියවිලි සත්‍යාපනය
- විදේශයන්හි අතරමංවී සිටින ශ්‍රී ලාංකිකයන් ආපසු ගෙන්වා ගැනීම
- ශ්‍රී ලාංකිකයන්ගේ මෘතදේහ මෙරටට ගෙන්වා ගැනීම
- වන්දි ගෙවීම සම්බන්ධීකරණය
- විදේශයන්හි දී විදේශ ගමන් බලපත්‍ර සොරකම් කිරීම හෝ නැතිවීම
- විදේශගත ශ්‍රී ලාංකිකයන්ගෙන් ලැබෙන වෙනත් ඕනෑම පැමිණිල්ලක්
- ශ්‍රී ලංකාවෙන් පිටත සිදුවන උපත්, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීම
- පොලිස් නිෂ්කාශන සහතිකය ලබා ගැනීම

# ශ්‍රී ලංකාවේ පැමිණිලි මෙහෙයවීමේ යාන්ත්‍රණය

**සංක්‍රමණික සේවකයා හෝ පවුලේ අය විසින් කරන ලද පැමිණිල්ල**

- **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**
  - ලියාපදිංචි සංක්‍රමණික සේවකයින්ගේ සියළුම පැමිණිලි හැසිරවීම
- **කොන්සියුලර් අංශය විදේශ කටයුතු අමාත්‍යාංශය**
  - ලියාපදිංචි නොවූ සංක්‍රමණික සේවකයන් ආපසු ගෙන්වා ගැනීම
  - ශ්‍රී ලාංකිකයන්ගේ මෘතදේහ මෙරටට ගෙන්වා ගැනීම
  - ගමනාන්ත රටෙහි සිරගතව සිටින සියළුම සංක්‍රමණික කම්කරුවන් පිළිබඳ සොයා බැලීම

# සුරක්ෂිත ශ්‍රම සංක්‍රමණිකයින්ගේ දුක්ගැනවිලි විසඳීමට ඇති යාන්ත්‍රණය

**සංක්‍රමණිකයන් මුහුණ දෙන දුක්ගැනවිලි බොහෝ ය.**

**සංක්‍රමණය වීමට සූදානම් වන විට, ගමනාන්ත රටෙහි අධ්‍යාපනය ලබමින් හෝ රැකියාව කරමින් සිටින අතරතුර, ඔවුන්ගේ පවුල්වල අය නිවසේ සිටින විට සහ ඔවුන් ආපසු පැමිණෙන විට ඔවුන්ට ඒවාට මුහුණ දීමට සිදු විය හැක.**

**සංක්‍රමණිකයන් සඳහා තිබෙන දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණයන් ලෙස වැදගත් වන ආයතන කිහිපයක් තිබේ:**

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
- ශ්‍රී ලංකා පොලිසිය
- දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- අධිකරණ
- නීති ආධාර කොමිසම
- සමථ මණ්ඩල
- විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
- මහාභාරකරු

## ශ්‍රී ලංකා තානාපති කාර්යාල විසින් සපයා දෙනු ලබන සේවාවන්

- ආරක්ෂිත බඳවා ගැනීමේ ක්‍රියාවලීන් සහතික කිරීම
- විදේශයන්හි සිටින සංක්‍රමණික සේවකයන්ගේ දුක්ගැනවිලි පිළිබඳ සොයා බැලීම
- සංක්‍රමණික සේවකයන් ආපසු ගෙන්වා ගැනීම
- පුද්ගලික රැකියා ගිවිසුම් ලියාපදිංචි කිරීම




## තානාපති අංශ මගින් ලබාදෙන සේවාවන්

### සංක්‍රමණික සේවකයෙකුගේ දුක්ගැනවිල්ලක්/පැමිණිල්ලක් වෙත යොමුවීමේ කාර්ය පටිපාටිය

01. පැමිණිල්ලේ මූලාශ්‍රය තීරණය කිරීම. කවුද?

02. ඉදිරිපත් කරන ලද පැමිණිල්ල වෙබ් පාදක පැමිණිලි කළමනාකරණ පද්ධතිය තුළ සටහන් කර ගැනීම.

03. සිද්ධි ගොනුව විවෘත කිරීම

04. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මාර්ගගත ලියාපදිංචි දත්ත හරහා සේවකයා පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබා ගැනීම

05. කාර්යය පවරා ඇති කම්කරු නිලධාරියා පැමිණිල්ල සමථයකට පත් කිරීමට යෙදවීම

06. සිද්ධි වෙත යොමු විය යුතු අනුපිළිවෙල සහ අනුගමනය කළ යුතු ක්‍රමවල මට්ටම තීරණය කිරීම

07. සතියක් ඇතුළත පැමිණිලි පාර්ශ්වයට ප්‍රගතිය වාර්තා කිරීම සහ සමථයකට පත් වන තෙක් පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීම

**රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව**

- සංක්‍රමණික සේවකයෙකුගේ මරණය ලියාපදිංචි කිරීම
- ගමනාන්ත රටක දී ශ්‍රී ලාංකික කාන්තාවකට උපන් දරුවෙකුගේ උප්පැන්න සහතිකය ලියාපදිංචි කිරීම
- විදේශීය ජාතිකයින් සඳහා විවාහ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය

**මහා භාරකාර**

- විදේශ වන්දි ගෙවීමට පහසුකම් සැලසීම

**රාජ්‍ය නොවන සංවිධාන**

- රාජ්‍ය නොවන සංවිධාන වලටද සංක්‍රමණිකයින්ගේ දුක්ගැනවිලි විසඳීමට ප්‍රවේශවීම සඳහා සහාය විය හැක

## නීති ආධාර කොමිසම

- සුදුසු පුද්ගලයින් සඳහා නීති උපදෙස්, අධිකරණවල නීති නියෝජනය සහ ප්‍රජා නීති ආධාර සායන සපයා දෙයි
- රු. 25,000 හෝ එයට අඩු මාසික ආදායමක් ලබන පුද්ගලයින් සඳහා නීති ආධාර සපයා දෙනු ලැබේ.
- වින්දිත සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයින් සඳහා ඔවුන්ගේ ආදායම් මට්ටම නොසලකා නීති ආධාර සපයනු ලැබේ
- සංක්‍රමණික සේවකයින්ට සහ ඔවුන්ගේ පවුල්වලට නීති ආධාර සපයනු ලැබේ
- කාන්තාවන්ට සහ ළමයින්ට ඔවුන්ගේ ආදායම් මට්ටම නොසලකා නඩත්තු ඉල්ලා සිටීමට නීති ආධාර සපයනු ලැබේ

## සමථ මණ්ඩලය

- පීඩාවට පත් සංක්‍රමණිකයන්ට සමථකරණය හරහා ඔවුන්ගේ ආරවුල් විසඳා ගැනීම පිණිස ප්‍රවේශ විය හැකි සමථ මණ්ඩල ශ්‍රී ලංකාවේ ඇත.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පිහිටා ඇති ප්‍රජා සමථ මණ්ඩල පුද්ගලික ආරවුල් විසඳා ගැනීමට උපකාරී වේ.




## ශ්‍රී ලංකා පොලීසිය

සංක්‍රමණිකයෙකුට සංක්‍රමණ ක්‍රියාවලියේදී ඇතිවන දුක්ගැනවිලි සඳහා ඕනෑම පොලිස් ස්ථානයකට පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය.




## දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල

දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, සංක්‍රමණිකයින් සහ ඔවුන්ගේ පවුල් මුහුණ දෙන සියලුම ආකාරයේ දුක්ගැනවිලි සඳහා සහාය වීමට කැපවූ නිලධාරීන් සිටිති. සෑම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ම සංක්‍රමණික සේවකයින්ට සේවය කිරීමට කැප වූ, විදේශ රැකියා සංවර්ධන නිලධාරී නම් විශේෂ නිලධාරියෙක් හෝ නිළධාරින් සිටියි.

## අධිකරණය



අධිකරණ විසින් කොන්ත්‍රාත්තු ඇතුළු සිවිල් ගැටළුවලට අදාළ සියලුම වැරදි සහ උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි. නීතිපති දෙපාර්තමේන්තුව විසින් අධිකරණයේ අපරාධ නඩු ගොනු කරනු ලබයි. වෙනත් ඕනෑම ගැටළුවක් සඳහා අධිකරණ වෙත ප්‍රවේශ වීමට යමෙකු නීතිඥයෙකු වෙත යා යුතුය. ඕනෑම උපකාරයක් සඳහා නීතිඥ සංගමය අමතන්න (www.basl.lk) නැතහොත් නොමිලයේ නීති සහාය ලබා ගැනීම සඳහා නීති ආධාර කොමිෂන් සභාව අමතන්න.



## අනාරක්ෂිත සංක්‍රමණ ක්‍රියාවලියේ ඇති අවදානම සහ නීතිමය තත්වයන්




ආගමික හා විගාමික පනත යටතේ වන වැරදි



## මිනිස් වෙළඳාමේ වින්දිතයෙක් විය හැක



ලිංගික සූරාකෑම



බලහත්කාරයෙන් වැඩගැනීම



වහල්භාවය



ගෘහස්ත දාසකම/ වහල්කම



අවයව ඉවත් කිරීම



බලහත්කාරයෙන් සිඟමනේ යෙදවීම



ළමා සොල්දාදුවන්



බලහත්කාරයෙන් විවාහ කිරීම

**දණ්ඩ නීති සංග්‍රහය 360 වන වගන්තිය** ↔ **දඬුවම: අවුරුදු 2-20 ත් අතර සිර දඬුවමක් සහ දඩ මුදලක්**

# අනාරක්ෂිත සංක්‍රමණයේ දී සිදුවිය හැකි අක්‍රමිකතා

## රැවටීම සහ වංචා කිරීම


- රැකියා නියෝජිතයින් විසින්
- උප නියෝජිතයින් විසින්

**දණ්ඩ නීති සංග්‍රහයේ 398 වගන්තිය යටතේ වරදක් ලෙස සලකනු ලබයි**



## ව්‍යාජ ලේඛන සැකසීම

- උප්පැන්න සහතික
- ජාතික හැඳුනුම්පත්
- විවාහ සහතික
- විදේශ ගමන් බලපත්‍ර
- වීසා
- අධ්‍යාපන සහතික



**ආගමික සහ විගාමික පනත සහ දණ්ඩ නීති සංග්‍රහයේ 452 වගන්තිය යටතේ වරදක් ලෙස සලකනු ලබයි**

# ඔබට අවශ්‍ය සහාය සඳහා වන ආයතනවල දුරකථන අංක

| | |
|---|---|
| 01123 92 917 | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (නීති විරෝධිව පුද්ගලයින් වෙළඳාම් කිරීම/ ජාවාරම් කිරීම වැළැක්වීමේ ඒකකය) |
| 1929 | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය |
| 0112 444 444 | පොලීසිය - කාන්තා හා ළමා කාර්යාංශය |
| 119 | පොලිස් හදිසි ඇමතුම් ඒකකය |
| 0112 421 111 | පොලිස් මූලස්ථානය |
| 1989 | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ක්ෂණික ඇමතුම් අංශය |
| 0112 331 336<br>0112 330 307 | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය |
| 0112 446 302<br>0112 338 812 | විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය |

